රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 168.

මගේ අංක. 2/9/771 (එච්)
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ-7.
1980 ජූලි මස 22 දින,

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් වෙත.

## 1980 ජූලි වැඩ වර්ජනය - තනතුර අතහැර යෑම.

1980.07.18 වැනි දින කාර්යාලයට නොපැමිණීමේ හේතුවෙන් තනතුර අතහැර ගියා වූද තමන්ගේ නොපැමිණීම වැඩ වර්ජනය නිසා නොව වෙනත් නොවැළැක්විය හැකි හේතූන් නිසා යයි කියා සිටින්නා වූද අය සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී පහත දැක්වෙන උපදෙස් අනුගමනය කළ යුතු ය:-

(1) විටිමත් වෛද්‍ය සහතික මත නොපැමිණීම.
(නිදහසට කරුණු ලෙස ඉදිරිපත් කර ඇති වෛද්‍ය සහතික ඉතා සැලකිලිමත්ව පරීක්ෂාකර බැලිය යුතු අතර, ඉතා සුළු වශයෙන් වත් සැකයක් තිබේ නම් එම සහතික ඔවුන්ගේ පෙර සේවා වාර්තා අනුව පරීක්ෂා කර බලා අවශ්‍ය නම් නැවතද පරීක්ෂා කළ යුතු ය.)
ආයතනයක යම්කිසි ශ්‍රේණියක් පිළිබඳව දළ වශයෙන් කළ හැකි පරීක්ෂණයක් වන්නේ එම ශ්‍රේණියේ සාමාන්‍යයෙන් අසනීප නිවාඩු මත වැඩට නොපැමිණෙන මුළු සේවක සංඛ්‍යාව යි. දැන් ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය සහතික ගණන එම ආයතනයේ එම ශ්‍රේණිය සඳහා සාමාන්‍යයෙන් ඉදිරිපත් වන සංඛ්‍යාවට වැඩි වන්නේ නම්, එය පරීක්ෂා කිරීම අවශ්‍ය වේ.

(ii) ආයතනයක ප්‍රධානියාට හෝ ශාඛාවට 1980.07.18 වැනි දින වහාම දන්වන ලද අසනීප හෝ ඊට සමාන හේතූන්.

(iii) නිවාඩු අනුමත වීමත් එය ආරම්භ වීමත් 1980.07.17 වැනි දිනට පෙර වී නම් එවැනි නිවාඩු මත සිටි අය. (මෙහිදී ද 1980.07.21 වැනි දින අදාළ තැනැත්තා සේවය සඳහා වාර්තා කිරීමට උත්සාහ කළේදැයි සෝදිසි කළ යුතු ය.)

(iv) එවැනි අවස්ථාවලදී බිය ගැන්වීම නිසා හෝ බාධා කිරීම නිසා හෝ වැඩට පැමිණීමට නොහැකි වී යයි කියා සිටි අය. මෙම කරුණුද සෝදිසිකර බැලීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, ඔවුන් වැඩ වර්ජනයට සහභාගි වූ වෘත්තීය සමිතියක සාමාජිකයන් වන්නේ නම්, බිය ගැන්වීම නිදහසට කරුණක් වශයෙන් නොපිළිගත යුතු ය.

02. කරුණාකර මේ අනුව කටයුතු කරන්න.

වැඩබලන ලේකම්.
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

රණ/22.